# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2350/44 – 2023 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා – 2023.09.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/123.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.12.13 දිනැති හා අංක 2310/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/21ඒ හි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය (ඩී. එම්. කේ. ඩී. සේනාරත්න මයා වෙනුවෙන්) සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 84/2022 හා 2023.08.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ප්‍රදානය**

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය**

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය,
(ඩී. එම්. කේ. ඩී. සේනාරත්න මයා වෙනුවෙන්)
අංක 10/21ඒ, ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර,
මහරගම.

*ඉල්ලුම්කරු*

**නඩු අංකය: A84/2022**
**IR/COM/03/2019/123.**

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

අතර පවතින කාර්මික ආරාවුල

වර්ෂ 2023 ක් වූ අගෝස්තු මස 21 වන දින දීය.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය, මනූෂ නානායක්කාර මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත නම් සඳහන් ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු අතර පවතින, බේරුම්කරණය මගින් විසඳීමට අපේක්ෂිත මෙම ආරාවුලට තුඩුදුන් කාරණය පහත පරිදි වේ:

**'' ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ඩී. එම්. කේ. ඩී. සේනාරත්න මහතාට 2013.09.20 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී විනය විභාග නිලධාරී ආවරණ තනතුරට කරන ලද පත්කිරීම අනුව V ශ්‍රේණියට අදාල වැටුප හිමි ද? හිමිනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''**

ඉල්ලුම්කරු විසින් 2023.01.20 වන දිනැතිව සමස්ත ලංකා මෝටර් සේවක සමිතියේ ප්‍රධාන ලේකම් මගින් සිය ඉල්ලුම්පත සහකාර කම්කරු කොමසාරිස්තුමිය වෙත යොමුකරමින් වෙනත් දෑ අතර,

1. 2013.09.20 වන දින පැවති සම්මුඛ පරීක්ෂණය අනුව 2013.12.23 වන දිනැති පත්වීමේ ලිපිය මගින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුව විනය විභාග නිලධාරි තනතුර ආවරණය කිරීමට පත්කරන ලද බවත්, එකී පත්වීම ලබාදෙන ලද්දේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2013 අංක 5 දරන මානව සම්පත් කළමණාකරන කොට්ඨාස චක්‍ර ලිපිය අනුව බවත්,

2. ඉන්පසුව මෙම ආවරණ පත්වීම ස්ථිර නොකිරීම මත ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ජ්‍යෙෂ්ඨ විනය නිලධාරිතැන හරහා ප්‍රාදේශීය කළමණාකාරතැන මගින් ශ්‍රී ලංගම සභාපතිතුමා වෙත යොමුකරන ලද බවත්,

3. 4 වන වගන්තිය යටතේ විනය චෝදනාවලට ලක්ව සිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගාල්ල ඩිපෝවේ 2 වන පෙළ කාර්මික සී. පී. කණ්ඩම්බි මහතාගේ සේවය 2015.02.10 වන දිනැති ලිපිය මගින් ප්‍රතිස්ථාපනය කරන ලද බවත්, ඔහුව 2015.05.12 වන

දින IV වන ශ්‍රේණියේ කර්මාන්ත ඉංජිනේරු තනතුරේ වැඩ ආවරණය කිරීමට පත්කරන ලද බවත්, එම තනතුර ස්ථිරකොට වැටුප් ගෙවීමට නියෝග කර ඇති බවත්,

4. එම කාරණා හේතුකොටගෙන අසමාන ලෙස සැලකීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරන ලද බවත්,

5. අදවන විට දෙන ලද ආවරණ පත්වීම ස්ථිර නොකර තනතුරට අදල වැටුප් ලබා නොදී අවු. 10 කට ආසන්න කාලයක් ගතවී ඇති බවත්,

6. මීට අමතරව ආවරණ පත්වීම් විශාල සංඛ්‍යාවක් ස්ථිර කර වැටුප් ලබා දී ඇති බවත්,

7. ඉල්ලුම්කරුට වඩා අඩු සුදුසුකම්ලත් තැනැත්තන්ට ඉහළ ශ්‍රේණි පිරිනමා ඇති බවත්,

8. එසේ කිරීම තුළින් ඉල්ලුම්කරුට අසමාන ලෙස සලකා මෙම කාර්මික ආරාවුල හටගෙන ඇති බවත්,

ප්‍රකාශ කර ඇති අතර ඉල්ලුම්පත සමග **A** 1 සිට **A** 5 දක්වා ලේඛන ලකුණු කර ඇත.

ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් 2023.01.19 වන දිනැතිව ඉදිරිපත් කර ඇති පිළිතුරු ප්‍රකාශයේ (මුල් ප්‍රකාශයේ )වෙනත් දැ අතර,

1. ඉල්ලුම්කරු මුල්වරට කොන්ත්‍රාත් පදනම යටතේ බස් කොන්දෙස්තර තනතුරටත්, පසුව ii වන පෙළ කොන්දෙස්තර, ViiA ඩිපෝ පරීක්ෂක, අනතුරු නිලධාරි, කාලසටහන් නිලධාරි, ආදී තනතුරුවලට පත්ව ඇති බවත්,

2. ඉල්ලුම්කරු සිය සේවා කාලය තුළදී මාර්ග ලේඛන මුදල් අඩුවෙන් භාරදීම, නියමිත කාර්යය සඳහා සේවයට නොපැමිණීම, පඩිරහිත නිවාඩු ලබාගැනීම, පඩි රහිත නිවාඩු 20ක් ලබාගැනීම, ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම, මුදල් අය නොකිරීම, මාර්ග ලේඛන නම සහ අත්සන සටහන් නොකිරීම, නියමිත සේවයට වාර්තා නොකිරීම වැනි වැරදිවලට වැරදිකරු වී වේතන දඩ අවවාදකිරීම් ලබා ඇති බවත්,

3. ප්‍රධාන මානව සම්පත් කළමණාකාර තැනගේ අංක ශ්‍රී ලංගම/මාසක/ ආවරණ පත්/විධා/42/2013 හා 2013.12.23 වන දිනැති ලිපිය මගින් ඉල්ලුම්කරුව විනය විභාග නිලධාරි තනතුර ආවරණය කිරීම සඳහා පත්කර ඇති බවත්,

4. වගඋත්තරකරුට එරෙහිව පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවලදී ලබා දී ඇති අතුරු නියෝග අනුව ආයතනයේ පැවැත්ම අවහිරයකින් තොරව පවත්වාගෙන යාම සඳහා පහත කොන්දේසිවලට යටත්ව ආවරණ ලිපි ලබාදිය හැකි බව තීරණය කර ඇති බවත්, එනම්ඃ

    i. එකී පත්වීම් ලබාදීමට පවතින සේවා අවශ්‍යතාවය.
    ii. එම පත්වීම් උසස්වීමක ස්වභාවයක් නොදැරිය යුතුය.
    iii. එම පත්වීම මගින් වැටුප් වැඩිවීමක් නොවිය යුතුය.
    iv. එම පත්වීම් ලබාදීමට පෙර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා නොගන්නේ නම් එලෙස පත්වීම් ලබාදුන් ලැයිස්තුව මීළඟ නඩු දිනයට සතියකට පෙර මෝසමක් මගින් අධිකරණයේ ගොනුකළ යුතුවේ.

5. වගඋත්තරකරු විසින් ආයතනික ව්‍යුහය සහ උසස්කිරීමේ පටිපාටිය අනුමත කර ගැනීම සම්බන්ධයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග කටයුතු කරමින් පවතින බවත්, සේවකයන් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින බවත්, එම නිසා මෙම අවස්ථාවේ මෙම ක්‍රියාවලියට බාහිරව හෝ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදීමට වගඋත්තරකරුට නොහැකි බවත්,

6. පිළිතුරු ප්‍රකාශය ගොනුකරන අවස්ථාවේ ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 15, 900/- ක් වන බවත්,

7. ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙසත්,

ප්‍රකාශකර ඇත.

ඉන්පසුව **වගඋත්තරකරු විසින් 2023.01.26 වන දිනැති දෙවන ප්‍රකාශය** ගොනුකරමින් ඉහත සඳහන් කළ සිය 2023.01.19 වන දිනැති පිළිතුරු ප්‍රකාශයේ සඳහන් කරුණුම නැවත පුනරුච්ඡාරණය කරමින්, ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙස අයැද ඇත.

අනතුරුව **ඉල්ලුම්කරු විසින් A6 - A9 දක්වා ලේඛන ලකුණු කරමින් 2023.01.27 වන දිනැතිව දෙවන ප්‍රකාශය ඉදිරිපත් කරමින්** වෙනත් දෑ අතර,

1. වගඋත්තරකරුගේ උත්තර ප්‍රකාශයේ 4,5,6,7,8 සහ 9 වන ඡේද ප්‍රතික්ෂේප කරන බවත්,

2. ඉල්ලුම්කරුට ආවරණ පත්වීම ලබාදුන් 2013.12.23 වන දිනම ආවරණ පත්වීමක් ලබාදුන් විනය විභාග නිලධාරි මහතාට 2015.06.22 වන දිනැතිව එම පත්වීම ස්ථිර කර V වන ශ්‍රේණියේ විනය විභාග නිලධාරි තැනට පත්කර ඇති බවත්,

3. පී. සෙව්මිණි චාරුණි පීරිස් මෙනවියටද, එන්. ඩබ්. පී. මදුෂිකා ප්‍රියානි මෙනවියට ද, එම්. ඩබ්. යූ. එස්. බණ්ඩාර මැදිවක මහතාට ද ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමණාකාර මගින් පත්වීම් ලිපි 3ක් ප්‍රදානය කර ඔවුන් දැනටමත් ශ්‍රී ලංගමය තුළ සේවය කරමින් සිටින බවටත්,

4. ඉල්ලුම්කරු මාසිකව රු. 42000/- කට අධික වැටුපක් ලබාගත් බවටත්,

5. වගඋත්තරකරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය චක්‍රලිපියක් නිකුත්කර, සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, චක්‍ර ලිපියට අනුව නියමිත තනතුර ලබා නොදී ආවරණ පත්වීමක් ලබා දී තනතුරේ රාජකාරි කරවාගෙන හිමි වැටුප් ලබානොදී, වෙනත් අයට ලබාදුන් ආවරණ පත්වීම් ස්ථිරකර අසමාන ලෙස සලකා ඇති බවත් ප්‍රකාශකරමින්, වගඋත්තරකරුගේ උත්තර ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලෙසත්, හිග වැටුප්, අභිමිකරන ලද තනතුර සහ නඩු ගාස්තු ලබාදෙන ලෙසත්, ගරු කාර්මික අධිකරණයට උචිත යැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදෙන ලෙසත් අයැද ඇත.

අනතුරුව නඩුව විභාගයට ගැනීමට පෙර ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශයන් සමග අමුණා ඇති ලේඛනවලින් <u>ඒ ඒ පාර්ශ්ව පිළිගනු ලබන සහ ප්‍රතික්ෂේප කරනු ලබන ලේඛන මොනවා ද යන්න</u> දින 14ක් ඇතුළත දිවුරුම් ප්‍රකාශයකින් ගොනුකරන ලෙසත්, පළමුවන විමසීමේ දිනයට සති දෙකකට පෙර ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය වගඋත්තරකරුට පිටපත් සහිතව ගොනුකරන ලෙසත් ගරු අධිකරණය විසින් 2023.01.27 වන දින නියෝග කර ඇත.

ඒ අනුව ඉල්ලුම්කරු විසින් 2023.02.08 වන දින සිය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය ගොනුකරමින්, වගඋත්තරකරුගේ පළමු හෝ දෙවන ප්‍රකාශ සමග කිසිදු ලේඛනයක් ඉදිරිපත්කර නැති බව සඳහන්කර ඇති අතර වැඩිදුරටත් දක්වා ඇත්තේ,

1. 2013.09.20 වන දින පැවති සම්මුඛ පරීක්ෂණය අනුව 2013.12.23 වන දිනැති පත්වීමේ ලිපිය මගින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුව විනය විභාග නිලධාරි තනතුර ආවරණයකිරීමට පත්කරනලද බවත්,

2. වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුවෙත ලබාදෙනලද ආවරණ පත්වීම ස්ථිරකර දෙනලෙස ඉල්ලුම්කරු විසින් 2015.03.25 දිනැතිව අභියාචනයක් ඉදිරිපත් කරනලද බවත්

3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගාල්ල ඩිපෝවේ 2වන පෙළ කාර්මික සී. පී. කණ්ඩම්බි මහතා මණ්ඩලයේ පැවති විනය විභාගයකදී සේවයෙන් පහකරතිබීම හේතුවෙන් කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොනුකර තිබූ අතර එයින් ලැබුණු තීන්දුවට විරුද්ධව වගඋත්තරකරු මහාධිකරණයට අභියාචනයක් කොට එකී අභියාචනය ඉල්ලා අස්කරගැනීමට පාලනාධිකාරිය විසින් කටයුතු කරනු ලබන බව දන්වමින් එකී සේවකයාගේ සේවය 2015.02.10 වන දිනැති ලිපිය මගින් ප්‍රතිස්ථාපනය කරනලද බවත්,

4. එලෙස ප්‍රතිස්ථාපනය කරනලද සේවකයා වෙත IVවන ශ්‍රේණියේ කර්මාන්ත ඉංජිනේරු ආවරණ තනතුරක් 2015.04.07 වන දිනැතිව ලබාදී 2015.05.12 වන දින එකී පත්වීම ස්ථිරකර වැටුප් ගෙවාඇති බවත්,

5. වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුහට ආවරණ පත්වීම ලබාදුන් දිනයේදීම එම තනතුරටම ආවරණ පත්වීමක් ලබාදුන් කේ.ජී. විමලසේන යන අයට එම පත්වීම 2015.06.22 වන දිනැතිව ස්ථිරකර V වන ශ්‍රේණියේ විනය විභාග නිලධාරි තනතුරට පත්කරඇති බවත්,

6. වගඋත්තරකාර ආයතනයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාරිණිය විසින් ඇයගේ අත්සනින් දෛනික පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් විශාල සංඛ්‍යාවක් ලබාදීඇති බවත්,

7. මේ ආකාරයට එකම දවසේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලබාගන්නාලද ආවරණ පත්වීම් අසමාන ලෙස සලකා ස්ථිර නොකිරීම මගින් හා අනිත් අයගේ පත්වීම ස්ථිර කිරීම මත අසමාන ලෙස සලකා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අසාධාරණ සහ අයුක්ති සහගතලෙස කටයුතුකිරීම මේ ආරාවුලට හේතුපාදක වූ බවත්,

සඳහන්කරමින් තමා හට අගතියක් සහ/ හෝ අසාධාරණයක් සිදුව ඇති හෙයින් ඒ මත සහන අයැද ඇත.

එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ප්‍රධාන විධායක නිළධාරි ගලපිටගෙදර මුදියන්සේලාගේ මහේෂ් කුලතිලක යන අය විසින් 2023.02.22 වන දිනැතිව ඉදිරිපත්කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත්කර ඇති A6, A7, A8, A9 යන ලේඛන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාර විසින් නිකුත් කරන ලද ලේඛනබව පමණක් පිළිගෙන ඇති අතර A1 - A5 දක්වා වන ලේඛන පිළිගන්නවාද නැද්ද යන්න පිළිබඳව එකී දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගතකොට නැත. එහෙයින් වගඋත්තරකරු විසින් එකී ලේඛන පිළිගත්තාසේ සැලකීමට හැකි බව සටහන් තබමි.

ඉල්ලුම්කරුගේ සහ වග උත්තරකරුගේ උත්තරවාද මගින් පහත සඳහන් කරුණු දෙපාර්ශ්වය විසින් පිළිගෙන ඇතඃ

- ඩී. එම්. කේ. ඩී. සේනාරත්න මහතාට 2013.09.20 වන දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා 2013.12.23 වන දිනැතිව විනය විභාග නිළධාරි තනතුර ආවරණය කිරීමට පත්වීමක් ලබාදී ඇති බව පිළිගනී.

- ඉල්ලුම්කරු මුල්වරට 1995.07.03 වන දින කොන්ත්‍රාත් පදනම යටතේ බස් කොන්දොස්තර තනතුරට පත්ව ඇති බවත්, ඉල්ලුම්කරුට සිය සේවා කාලය තුළ II පෙළ කොන්දොස්තර, Vii A ඩිපෝ පරීක්ෂක, අනතුරු නිළධාරි, කාලසටහන් නිළධාරි ආදී තනතුරු ලැබී ඇතිබව පිළිගනී.

ඉහතකී මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය මත ඇරඹි සාක්ෂි විභාගයේදී, ඉල්ලුම්කරුව හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව නැවත ප්‍රශ්න ඇසීමකින් තොරව ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කරන ලදී.

අනතුරුව, වගඋත්තරකරු වෙනුවෙන් එකම සාක්ෂිකරු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කොට්ඨාසයේ සහකාර මානව සම්පත් කළමණාකාරිණී (කාර්මික සබඳතා) යමුනා දසනායක මහත්මිය මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට ලක්කරමින් RI සිට R9 දක්වා ලේඛන ලකුණුකර වගඋත්තරකරුගේ නඩුව අවසන් කර ඇත.

ඉහත සඳහන් එක් එක් කරුණු මෙම ආරාවුලට අදාල සාක්ෂි විභාගයේදී කොපමණ දුරට වගඋත්තරකරු විසින් පිළිගෙන තිබේද එසේත් නැතහොත් ඉල්ලුම්කරු විසින් ඔප්පුකර තිබේද යන්න විමසා සිටිමි. ඒ අනුව, ඉල්ලුම්කරු විසින් අයැද ඇති කිනම් සහන ප්‍රදානය කළ හැක්කේද සහ කිනම් සහන බැහැරකළ යුත්තේද යන්න තීරණය වනු ඇති අතර විසඳිය යුතු ප්‍රධාන කරුණු පහත සඳහන් පරිදි වේඃ

i. ඉල්ලුම්කරුට 2013.09.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී විනය විභාග නිළධාරි ආවරණ තනතුරට කරනලද පත්කිරීම අනුව V වන ශ්‍රේණියට අදාල වැටුප හිමිද?

ii. ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කළ යුතුද ?

iii. එසේ නොකිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී තිබේද?

iv. ඉල්ලුම්කරුට හිමිවියයුතු සහන කවරේද?

බේරුම්කරු වශයෙන් මාගේ කාර්යභාරය වනුයේ පරීක්ෂණයේ ස්වභාවය, ආරාවුල ඉදිරිපත් කරනු ලබන අවස්ථාව වනවිට පාර්ශ්වයන්ගේ අයිතීන් හා වගකීම් සහ අයැද ඇති සහන මත සාධාරණ සහ යුක්ති සහගත (*just and equitable*) ප්‍රදානයක් ලබාදීමයි. එවැනි සාධාරණ සහ යුක්ති සහගත (*just and equitable*) ප්‍රදානයක් ලබාදීම සඳහා ඉහත කී විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳව එක්ව සහ/හෝ වෙන් වෙන්ව සවිස්තරාත්මකව විමසා බලනු ලබන අතර *Thirunavakarasu v. Siriwardena (1981) 1 SLR 185 at 191* නඩුව ප්‍රකාර බලතල ක්‍රියාවට නංවනු ඇත.

"*An industrial arbitrator has much wider powers both as regards scope of the inquiry and the kind of orders he can make than an arbitrator in civil law. In short, we can fairly say that arbitration under the industrial law intended to be even more liberal, informal, and flexible than the commercial arbitration*"

01. ඉල්ලුම්කරුට 2013.09.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී විනය විභාග නිළධාරී ආවරණ තනතුරට කරන ලද පත්කිරීම අනුව Vවන ශ්‍රේණියට අදාල වැටුප හිමිද? ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කළ යුතුද? එසේ නොකිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී තිබේද?

මෙහිදී ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ අංක *ශ්‍රීලංගම/මාසක/ආවරණපත්/විධා/42/2013* හා *2013.12.23* දිනැති ලිපිය මගින් ඉල්ලුම්කරුව විනය විභාග නිළධාරි තනතුර ආවරණය කිරීම සඳහා පත්කර ඇතිබව දෙපාර්ශ්වය හබයකින් තොරව පිළිගනී. ඉල්ලුම්කරු විසින් අදාල තනතුර සඳහා සුදුසුකම් සපුරා නොතිබුණේ නම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉල්ලුම්කරුව එම

තනතුර සඳහා පත්නොකළ යුතුව තිබුණි. එකී තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේදී ඊට අදාළ චක්‍රලේඛයේද අදාළ සුදුසුකම් සපුරා නොමැති සේවකයින්ගේ අයදුම්පත් ඉදිරිපත් නොකිරීමට ස්ථානභාර/අංශභාර නිළධාරි මහතුන් සහ ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර තරයේ වගබලාගත යුතුබවත්, විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල ලේඛන ඉදිරිපත්කිරීමට අපොහොසත්වන අයදුම්පත්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බවත් සඳහන්ව ඇති බවද නිරීක්ෂණය වන බැවින් ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සෑහීමට පත්ව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් එකී තනතුරට ඉල්ලුම්කරුව පත්කොට ඇති බව පෙනී යයි.

ඒ අනුව ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කළ යුතුද? ඉල්ලුම්කරුට V වන ශ්‍රේණියට අදාළ වැටුප හිමිද? සහ එකී උසස්වීම සහ වැටුප් මෙතෙක් ලබානොදීම මඟින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී තිබේද? යන්න සොයා බැලිය යුතුය.

වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, වගඋත්තරකරුට එරෙහිව පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවලදී ලබාදී ඇති අතුරු නියෝග අනුව ආයතනය අවහිරයකින් තොරව පවත්වාගෙනයාම සඳහා පහත කොන්දේසිවලට යටත්ව ආවරණ ලිපි ලබාදිය හැකිබව තීරණය කර ඇති බවයි. එනම්:

01. එකී පත්වීම් ලබාදීමට පවතින සේවා අවශ්‍යතාවය,

02. එම පත්වීම් උසස්වීමක ස්වභාවයක් නොදැරිය යුතුය,

03. එම පත්වීම මඟින් වැටුප් වැඩිවීමක් නොවිය යුතුය,

04. එම පත්වීම් ලබාදීමට පෙර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබානොගන්නේ නම් එලෙස පත්වීම් ලබාදුන් ලැයිස්තුව මීලඟ නඩු දිනයට සතියකට පෙර මෝසමක් මඟින් අධිකරණයේ ගොනුකළ යුතු වේ.

එසේ හෙයින්, වගඋත්තරකරුගේ ස්ථාවරය වන්නේ විනය විභාග නිළධාරි තනතුරට පත්වන සේවකයින් අවම ලෙස Vවන ශ්‍රේණියේ නිළධාරියෙකු විය යුතු බවත්, ඉල්ලුම්කරු දැනට සිටින්නේ Vii A ශ්‍රේණියේ වන බවත්, එම නිසා ඉල්ලුම්කරුට උසස්වීමක් ලැබෙන ආකාරයෙන් ආවරණ පත්වීම ස්ථිරකිරීමට හැකියාවක් නොමැති බවත්ය. ඉල්ලුම්කරු වෙත නිකුත් කර ඇති ඉහත කී පත්වීමේ ලිපියේ වැටුප් වැඩිකිරීමක් හෝ ශ්‍රේණියේ කිසිදු වෙනසක් සිදුනොවන බව සඳහන් කර ඇති බවත්, ඉල්ලුම්කරු ඉන් බැඳී පවතින බවත්, වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

එසේම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ආයතනික ව්‍යුහය සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගැනීම සම්බන්ධයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් පවතින බවත්, සේවකයින් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින බවත්, එබැවින් මෙම අවස්ථාවේදී මෙම ක්‍රියාවලියට බාහිරව හෝ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදීමට හැකියාවක් නොමැති බවත් ප්‍රකාශකර ඇතත් වගඋත්තරකරුගේ එම ස්ථාවරය සාක්ෂි ලබාදීමේදී ඊට පටහැනි සාක්ෂි ලබාදෙමින් වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබාදුන් සාක්ෂිකාරිය විසින්ම බිඳහෙළා ඇති බව පහත උපුටා දැක්වීම් මඟින් පැහැදිලිව පෙනීයයි.

2023.03.08 වන දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමණාකාර (කාර්මික සම්බන්ධතා) 5 වන පිටුව - අධිකරණයෙන් විමසූ ප්‍රශ්න

ප්‍ර- නමුත් *covering appointment* එකේ ඉන්න කෙනෙකුට *promotion* එකක් දෙන්න එපා කියලා මේකෙන් අදහස් වෙනවද?

උ- නැහැ ස්වාමිනී

ප්‍ර- මේ අත්හිටුවීමේ නියෝගයේ තිබෙන්නේ අලුතින් දෙන ආවරණ පත්වීමක් මෙන්න මේ සීමා දෙක ඇතුළේ දෙන්න ඕනෑ කියලා. නමුත් දීලා තිබෙන ආවරණ පත්වීමක් ස්ථිර කිරීමක් ගැන මේකෙ තහනමක් නැහැ නේද?

උ- මේ දීලා තියෙන එකේ සඳහනක් නැහැ

එසේම, ශ්‍රේෂ්ඨාධිකරණ අතුරු නියෝග බලපැවැත්වෙන්නේ 2019.07.17, 2019.09.24 යන දිනයන්හිදී සිට බවත්, ඉල්ලුම්කරුගේ ආවරණ පත්වීමේ ලිපිය නිකුත්කර ඇත්තේ ඊට වසර ගණනාවකට පෙර 2013.12.23 වන දිනදී වන බවත්, ඉල්ලුම්කරුගේ ආවරණ පත්වීමේ ලිපිය නිකුත්කළ දිනම එම තනතුර සඳහාම ආවරණ පත්වීමේ ලිපි නිකුත්කරන ලද වෙනත් සේවකයින්ගේ තනතුරු ස්ථිර කිරීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කටයුතුකර ඇති බවත්, එම තනතුරට අදාලව ඔවුන්ගේ ශ්‍රේණිය V වන ශ්‍රේණිය දක්වා උසස්කිරීමට කටයුතුකර ඇති බවත් නිරීක්ෂණය කරමි.

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළණමනාකාර (කාර්මික සම්බන්ධතා) 17 වැනි පිටුව

ප්‍ර- දැන් මේ ඉල්ලුම්කාරයාව ස්ථිර නොකිරීමේ හේතුව මේ R8 සහ R9 ලේඛනය ද?

පි- දැනට තිබෙන්නේ එම හේතුව

ප්‍ර- එතකොට මේ හේතුව පැන නගින්නේ 2019.07.17 ඉඳන් නේ ද ?

පි- ඔව්

ප්‍ර- මේ හේතුව නොමැතිනම් මේ ඉල්ලුම්කාර ඩී. එම්. කේ. ඩී. සේනාරත්න මහතා ස්ථිර කිරීමට බාධාවක් තියනව ද?

පි- නැහැ

තවද, වගඋත්තරකරුගේ ස්ථාවරය අනුව අයැදුම්පත් කැඳවීමේ දී මෙම විනය විභාග පරීක්ෂණ නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවිය යුතු අවම සුදුසුකම *V වන ශ්‍රේණියේ* සේවකයකු නම් ඒ සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දී එකී සුදුසුකම් සපුරන අයැදුම්කරුවන්ට පමණක් අයැදුම්පත් එවන ලෙස ඊට අදාළ චක්‍රලේඛයේ සඳහන් කළ යුතුය. නමුත් විනය විභාග නිලධාරි තනතුර - v ශ්‍රේණිය සඳහා අයැදුම්පත් කැඳවීමේදී එකී චක්‍රලේඛයේ එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් 1.3 යටතේ දක්වා ඇත්තේ, අ.පො.ස. (සා/පෙළ) සමත් VI/VII ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද ඇත්තම් ඒ සඳහා අයදුම්පතක් ඉදිරිපත්කළ හැකි බවයි. ඒ යටතේ අයදුම්පතක් යොමුකොට ඇති ඉල්ලුම්කරු බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ද සමත්ව විනය විභාග නිලධාරි ආවරණ තනතුරට පත්ව ඇති හෙයින් අදාළ පුහුණු කාලසීමාව (ඇත්නම්) අවසානයේ ඔහුගේ තනතුර විනය විභාග නිලධාරි (V ශ්‍රේණිය) ලෙස උසස් විය යුතු බව තීරණය කරමි. එසේම එකී කාලය තුළ වෙනත් නිලධාරින්ගේ පත්වීම්ද උසස් කර ඇති බව සහ ඔවුන්ගේ වැටුප් වැඩිකර ඇතිබව ද, ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර නොකිරීමෙන් සහ ඔහුගේ වැටුප් වැඩි නොකිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇතිබව ද නිලධාරින් උසස්කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු සතුව නිසි ක්‍රමවේදයක් නොමැති බව ද නිරීක්ෂණය කරමි.

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමණාකාර (කාර්මික සම්බන්ධතා) 8 වැනි පිටුව

ප්‍ර - සාක්ෂිකාරිය දැනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උසස්වීම් කාර්යය පටිපාටියක් තිබෙනව ද?

පි - නැහැ

ප්‍ර - බඳවා ගැනීමේ කාර්යය පටිපාටියක් ක්‍රියාත්මක වෙනවා ද දැනට?

පි - නැත ස්වාමීනි

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මීය, සහකාර මානව සම්පත් කළමණාකාර (කාර්මික සම්බන්ධතා) 9 වැනි පිටුව - අධිකරණයෙන් විමසූ ප්‍රශ්න

ප්‍ර - කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් පමණයි ආයතනයේ සේවකයෝ ස්ථිර කරන්න ඕනේ, බඳවාගන්න ඕනේ කියලා කොහේ හෝ සඳහනක් තියෙනව ද? මොකද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනම පනතකින් පිහිටුවපු සංස්ථාවක් නේ ද?

පි - එහෙමයි ස්වාමිනි

ප්‍ර - එතකොට එහි අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ තීරණ ගන්න පුළුවන් නේ ද?

පි - එහෙමයි

ප්‍ර - රේඛීය දෙපාර්තමේන්තුවේ අමාත්‍යවරයාගේ පාලනයට යටත්ව තීරණ ගන්න පුළුවන් නේ ද?

පි - එහෙමයි

ප්‍ර - එතකොට කොහොමද කියන්නේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මතය විමසන්නේ නැතුව සේවකයෙක් උසස් කරන්න බැහැ කියන පදනම කුමක් ද?

පි - උසස්වීම් ලබා දෙන්න පුළුවන් එයාලා කියන්නේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරලා සුදුසුම කෙනා පත්කරන්න ඕනේ කියන එක

ප්‍ර - ඒ කියන්නේ පූර්ව නිර්ණායකයක් විනා කරන්න එපා කියලා නැහැ නේද?

පි - එපා කියලා නැහැ එගොල්ලෝ දැනුම්දීලා තියෙනවා මේ තනතුරට සුදුසුකෙනා පත්කරන්න ඕනෙ කියන එක

එසේම ඉල්ලුම්කරු විසින් A 3 වශයෙන් ලකුණුකර ඉදිරිපත්කර ඇති 2015.03.25 වැනි දිනැති ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ විනය නිලධාරිතැන මඟින් සහ ප්‍රාදේශීය කළමණාකාරතැන මඟින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමාවෙත යොමුකොට ඇති අභියාචනය මඟින් ඉල්ලුම්කරු විසින් සිය තනතුර ස්ථිරකරගැනීම උදෙසා 2014.08.29 වැනි දින ද අභියාචනයක් ඉදිරිපත් කරන ලද බවත්, වසරක් ගතවූ පසු අදාළ තනතුර ස්ථිර කරනු ලබන බවට එහිදී දන්වා සිටි බවත් සඳහන්කර ඇත. එසේම එකී ලිපියට පැති සටහනක් යොදමින් ගමනාගමන මණ්ඩලයේ කිසියම් නිලධාරියෙකු විසින් "මෙම විභාග නිලධාරිතැන පවරන ලද රාජකාරි නිසි අයුරින් විශ්වාසනීයව කටයුතු කර ඇති බවත්, තනතුර ස්ථිර කිරීමට සුදුසුයැයි" නිර්දේශකොට ඇති බවත් එකී නිර්දේශකිරීම 2015 වර්ෂයේ දී කර ඇති බවත් එකී A 3 ලේඛනය වගඋත්තරකරු විසින් ප්‍රතික්ෂේපකොට නොමැති බැවින් එකී ලේඛනය පිළිගත්තාසේ සැලකියහැකි බවත් වැඩිදුරටත් නිරීක්ෂණය කරමි.

ඉහත සඳහන්කළ පරිදි උත්තරවාදවල සඳහන් කරුණු සහ සාක්ෂි විභාගයේ දී ඉදිරිපත්වූ කරුණු අනුසාරයෙන් විමසා බලන කළ අනෙකුත් නිලධාරීන්ගේ තනතුරු ස්ථිර හෝ උසස්කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/239/2019 හි දී 2019.07.17, 2019.09.24 යන දිනවල දී ලබා දී ඇති අතුරු නියෝග අදාළ කරගෙන නොමැති බවත්, ඉල්ලුම්කරුගේ සේවය ස්ථිරකිරීම සම්බන්ධයෙන් ද එකී අතුරු නියෝග අදාළ නොවන බවට සාක්ෂි ලබාදී ඇති බවත්. ඉතා පැහැදිලි බැවින් ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර නොකිරීමෙන් සහ එම තනතුර සඳහා හිමිවියයුතු වැටුප ලබානොදීමෙන් ඉල්ලුම්කරුහට අසාධාරණයක් වී ඇති බවටත්, ඔහුගේ තනතුර ස්ථිර වියයුතු බවටත්, ඒ අනුව ඔහුගේ ශ්‍රේණිය V වන ශ්‍රේණිය දක්වා උසස්විය යුතු බවටත්, එම තනතුර සඳහා ලැබිය යුතු වැටුප හිමිවිය යුතු බවටත් තීරණය කරමි.

එසේම පහත නඩුතීන්දු මඟින් ද සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බව පෙන්වා දී ඇත.

*Ramupillai vs. Minister of Public Administration, Provincial Councils and Home affairs & others 1991 (1) Sri. L. R. at 44 දරන නඩුවේ දී රණසිංහ අගවිනිසුරුතුමන් විසින් නඩු තීන්දු ගණනාවක් උපුටා දක්වමින්, සේවක අයිතීන් අභිමුව නීතිය පසිඳලීම (equality before Law) සහ නීතියේ රැකවරණය (equal protection of Law) යන සංකල්ප මනාව විග්‍රහකර ඇත. ඒ අනුව, State of Kerala vs. Thomas and others IR 1976 SC 490, Probhudas Morarjee vs. Union of India AIR 1966 SC 1044, Railway Express Agency vs. New York (1949) 336 US 100, S.C Perera vs. University Grants Commission S.C Application No. 88 of 1980 යන නඩු තීන්දු ගෙනහැර දක්වමින් තීරණයකර ඇත්තේ, සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රකාර සමානාත්මතාව යන්න විමසා ඇත*

*“The provisions of Article 12(1) and (2) bring within their reach equality of opportunity for employment as well and that such guarantee of equality applies not only in the matter of selection for employment, but also at the stage of selection for promotion.”*

*තව ද, රාජ්‍ය සේවයේ සමාන අවස්ථා සැලසීම සේවයට තෝරා ගැනීමේ දී මෙන්ම යම් තනතුරුවලට උසස් කිරීමේ දී ද තහවුරු වියයුතු බව එකී නඩුවේ දී ම Seervai, Constitutional Law of India, Volume 1, 3rd Edition හි 423 වැනි පිටුව උපුටා දක්වමින් තීරණයකර ඇත.*

*“Equality of opportunity in matters of public employment cannot be confined to the intial matters prior to the act of employment, but include other matters relating to employment, such as promotion to selected posts.”*

**02. ඉල්ලුම්කරුට හිමිවියයුතු සහන කවරේද?**

ඉහත සාක්ෂි සම්පිණ්ඩනය මත ඉල්ලුම්කරු නිසි ශ්‍රේණියේ පිහිටුවා නොමැති බව වැඩිබර සාක්ෂි සහ පිළිගත් කරුණු මත ඔප්පුකොට ඇති හෙයින්, ඉල්ලුම්කරුට වැටුප් විෂමතාවක් සිදුව ඇතිබව ද තහවුරු වේ.

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමනාකාර (කාර්මික සම්බන්ධතා) 18 වැනි පිටුව - අධිකරණය විසින් අසන ලද ප්‍රශ්න

ප්‍ර - සාක්ෂිකාරිය ඔබතුමියට කියන්න පුළුවන් ද මේ ඉල්ලුම්කරු යම් දවසක ස්ථිර කළොත් වැටුපේ පරතරය ගැන කිසිම අදහසක් මෙහි නැහැ නේ ද? කොහොම ද අපි ඒ වගේ එකක් අධ්‍යයනය කරන්නේ කොච්චර ද කියලා?

පි - V සහ VII අතර තිබෙන වැටුප් වෙනස

ඒ අනුව VII ශ්‍රේණියේ සිට V ශ්‍රේණිය දක්වා ස්ථිර පත්වීමක් ලැබුවේනම් 2013.09.20 වැනි දින සිට 2022.11.02 දින දක්වා ඉල්ලුම්කරුට හිමිවිය යුතු වැටුප් වර්ධකයේ එක් එක් වර්ෂයක් සඳහා වූ ප්‍රමාණය සහ අනෙකුත් දීමනා ඇත්නම් එහි ප්‍රමාණය නිශ්චිතව සඳහන් කරනු ලබන වාර්තාවක් ලිඛිත දේශන සමඟ අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය මුදල් කළමණාකාර, කොළඹ ප්‍රාදේශීය කාර්යාලය වෙත කරනලද නියෝගය අනුව ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව ගෙවිය යුතුව පවතින හිඟ මුදල වන රු. 95,819.98 ක (රුපියල් අනූ පන් දහස් අටසිය දහනමයයි ශත අනූ අටක) මුදල මෙම නියෝගය *ගැසට්ගත* කිරීමෙන් මසක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැම්පත්කරන ලෙසද, මින් ඉදිරියට V වැනි ශ්‍රේණියට නියමිත වැටුප ඉල්ලුම්කරු වෙත ගෙවන ලෙසට ද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කරමි. මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

බණ්ඩාර සෙනරත්,
බේරුම්කරු.

2023 අගෝස්තු මස 10 වැනි දින.

EOG 09 - 0197

---

මගේ අංකය: IR/COM/03/2019/128.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.12.13 දිනැති හා අංක 2310/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/21ඒ හි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය (ඕ. ජී. එන්. කේ. සී. පෙරේරා මයා වෙනුවෙන්) සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 85/2022 හා 2023.08.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ප්‍රදානය**

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.**

සමස්ථ ලංකා මෝටර් සේවක සමිතිය,
(ඕ. ජී. එන්. කේ. සී. පෙරේරා මයා *වෙනුවෙන්*)
10/21ඒ, ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර,
මහරගම.

*ඉල්ලුම්කරු*

නඩු අංකය - A85/2022.
IR/COM/03/2019/128.

එදිරිව:

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*වගඋත්තරකරු*

වර්ෂ 2023 ක් වූ අගෝස්තු මස 21 දින දී ය.

**(1) බේරුම්කරු පත් කිරීම:**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත නම් සඳහන් ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු අතර පවතින, <u>බේරුම්කරණය මගින් විසඳීමට අපේක්ෂිත මෙම ආරාවුලට තුඩු දුන් කාරණය</u> පහත පරිදි වේ.

*"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ඕ. ජී. එන්. කේ. සී. පෙරේරා මහතාට 2013.09.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී විනය විභාග නිලධාරි ආවරණ තනතුරට කරනලද පත්කිරීම අනුව V ශ්‍රේණියට අදාළ වැටුප හිමි ද? හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ"*

ඉල්ලුම්කරු විසින් <u>2023.01.20 වැනි දිනැතිව</u> සමස්ත ලංකා මෝටර් සේවක සමිතියේ ප්‍රධාන ලේකම් මඟින් සිය <u>ඉල්ලුම්පත</u> සහකාර කම්කරු කොමසාරිස්තුමිය වෙත යොමුකරමින් වෙනත් දෑ අතර,

1. 2013.09.20 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණය අනුව 2013.12.23 වන දිනැති පත්වීමේ ලිපිය මඟින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුව විනය විභාග නිලධාරි තනතුර ආවරණය කිරීමට පත්කරනලද බවත්, එකී පත්වීම ලබාදෙන ලද්දේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2013 අංක 5 දරන මානව සම්පත් කළමණාකරණ කොට්ඨාස චක්‍රලිපිය අනුව බවත්,

2. ඉන්පසුව මෙම ආවරණ පත්වීම ස්ථිර නොකිරීම මත ඒ සම්බන්ධයෙන් සහකාර මානව සම්පත් කළමණාකාර විනය තැන මඟින් ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැන හරහා ශ්‍රී ලංගම සභාපතිතුමා වෙත යොමුකරනලද බවත්,

3. 2015.02.10 වැනි දිනැතිව ගාල්ල ඩිපෝවේ සේවයකළ සී. පී. කණ්ඩම්බි මහතා 2 වන පෙළ කාර්මිකයෙකු ලෙස සේවය ප්‍රතිස්ථාපනයකළ බවත්, ඔහුට 2015.05.12 වන දින IV වන ශ්‍රේණියේ කාර්මාන්ත ඉංජිනේරු තනතුරේ වැඩ ආවරණය කිරීමට පත්කරනලද බවත්, එම තනතුර ස්ථිරකොට වැටුප් ගෙවීමට නියෝගකර ඇති බවත්,

4. එම කාරණා හේතුකොටගෙන අසමානලෙස සැලකීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරනලද බවත්,

5. අද වනවිට දෙනලද ආවරණ පත්වීම ස්ථිරනොකර තතුරට අදාල වැටුප් ලබානො දී අවුරුදු 10 කට ආසන්න කාලයක් ගතවී ඇති බවත්,

6. මීට අමතරව ආවරණ පත්වීම් විශාල සංඛ්‍යාවක් ස්ථිරකර වැටුප් ලබා දී ඇති බවත්,

7. ඉල්ලුම්කරුට වඩා අඩු සුදුසුකම්ලත් තැනැත්තන්ට ඉහල ශ්‍රේණි පිරිනමා ඇති බවත්,

8. එසේ කිරීම තුළින් ඉල්ලුම්කරුට අසමානලෙස සලකා මෙම කාර්මික ආරාවුල හටගෙන ඇති බවත්,

ප්‍රකාශකර ඇති අතර ඉල්ලුම්පත සමඟ <u>A 1 සිට A 5 දක්වා ලේඛන</u> ලකුණුකර ඇත.

ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් 2023.01.19 වැනි දිනැතිව ඉදිරිපත්කර ඇති පිළිතුරු ප්‍රකාශයේ (මුල් ප්‍රකාශයේ) වෙනත් දෑ අතර,

1. ඉල්ලුම්කරු මුල්වරට 2006.12.11 දින ඩිපෝ/මාර්ග පරීක්ෂක - Viii A තනතුරට පත්ව ඇති බවත්, ප්‍රධාන මානව සම්පත් කළමණාකාරගේ ශ්‍රී ලංගම/මාසක/පී.එල්.ආර්/176(ii)/2008 හා 2008.09.25 වැනි දිනැති ලිපිය මඟින් ඉල්ලුම්කරුගේ තනතුරු නාමය Viii B ශ්‍රේණියේ ලිපිකරු වශයෙන් සංශෝධනය කර ඇති බවත්,

2. ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ 2010.10.12 දිනැති හා අංක ශ්‍රී ලංගම/මාසක/සේවය/ස්ථිර/2010 දිනැති ලිපිය මඟින් Viii B ශ්‍රේණියේ ලිපිකරු තනතුර ලබා දී ඇති බවත්, ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ 2013.12.23 දිනැති හා අංක ශ්‍රී ලංගම/මාසක/ආවරණපත්/විධා/42/2013 මඟින් විනය විභාග නිලධාරි තනතුර ආවරණය කිරීම සඳහා පත්කර ඇති බවත්,

3. වගඋත්තරකරුට එරෙහිව පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක <u>SCFR/239/2019</u> හිදී <u>2019.07.17, 2019.09.24</u> යන දිනවල දී ලබා දී ඇති අතුරු නියෝග අනුව ආයතනයේ පැවැත්ම අවහිරයකින් තොරව පවත්වාගෙනයාම සඳහා පහත කොන්දේසිවලට යටත්ව ආවරණ ලිපි ලබාදිය හැකි බව තීරණයකර ඇති බවත් එනම්,

   i. එකී පත්වීම් ලබාදීමට පවතින සේවා අවශ්‍යතාවය
   ii. එම පත්වීම් උසස්වීමක ස්වභාවයක් නොදැරිය යුතුය.
   iii. එම පත්වීම මඟින් වැටුප් වැඩිවීමක් නොවිය යුතුය
   iv. එම පත්වීම් ලබාදීමට පෙර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබානොගන්නේ නම් එලෙස පත්වීම් ලබාදුන් ලැයිස්තුව මීලඟ නඩු දිනයට සතියකට පෙර මෝසමක් මඟින් අධිකරණයේ ගොනුකළ යුතුය.

4. ඉල්ලුම්කරු දැනටමත් Vii A ශ්‍රේණියේ සිටින සේවකයෙක්වන අතර විනය විභාග නිලධාරි තනතුර පත්වන විට අවම ලෙස V ශ්‍රේණියේ නිළධාරියෙකුවිය යුතු බවත්, එමනිසා මෙම ඉල්ලුම්කරුට උසස්වීමක් ලැබෙන ආකාරයේ ආවරණ පත්වීම ස්ථිරකිරීමට වගඋත්තරකරුට හැකියාවක් නොමැති බවත්,

5. වගඋත්තරකරු විසින් ආයතනික ව්‍යුහය සහ උසස්කිරීමේ පටිපාටිය අනුමතකරගැනීම සම්බන්ධයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ කටයුතුකරමින් පවතින බවත්, සේවකයන් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුමතකර ගැනීමේ ක්‍රියාවලිය අවසන් අධියරේ පවතින බවත්, එම නිසා මෙම අවස්ථාවේ මෙම ක්‍රියාවලියට බාහිරව හෝ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදීමට වගඋත්තරකරුට නොහැකි බවත්,

6. පිළිතුරු ප්‍රකාශය ගොනුකරන අවස්ථාවේ ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 15,475/- ක් වන බවත්,

7. ඉල්ලුම්කරු සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් කිසිඳු අසාධාරණ ක්‍රියාවක් සිදුකර නොමැති බවත්, සද්භාවයෙන් කටයුතුකර ඇති බවත් එහෙයින් වගඋත්තරකරුට එරෙහිව නඩු නිමිත්තක් උපචය වී නොමැති බවත්,

8. ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේපකරන ලෙසත්,

9. නඩු ගාස්තු සහ ගරු කාර්මික අධිකරණයට උචිතයැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදෙන ලෙසත්,

ප්‍රකාශකර ඇත.

ඉන්පසුව වගඋත්තරකරු විසින් 2023.01.26 වන දිනැති දෙවන ප්‍රකාශය ගොනුකරමින් ඉහත සඳහන්කළ සිය පළමු ප්‍රකාශයේ සඳහන් කරුණුම නැවත පුනරුච්ඡාරණය කරමින්, ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙස අයැ ද ඇත.

අනතුරුව <u>ඉල්ලුම්කරු විසින් A 6 සිට A 9 දක්වා ලේඛන</u> ලකුණුකරමින් <u>2023.01.27 වන දිනැතිව දෙවන ප්‍රකාශය</u> ඉදිරිපත්කරමින් වෙනත් දෑ අතර,

1. වගඋත්තරකරුගේ උත්තර ප්‍රකාශයේ 2, 3, 4, 5 වන ඡේද පිළිගන්නා බවත්,

2. වගඋත්තරකරුගේ උත්තර ප්‍රකාශයේ 6, 7, 8, 9 වන ඡේද ප්‍රතික්ෂේප කරන බවත්,

3. ඉල්ලුම්කරුට ආවරණ පත්වීම ලබාදුන් 2013.12.23 වන දිනම ආවරණ පත්වීමක් ලබාදුන් විනය විභාග නිලධාරි මහතාට 2015.06.22 වන දිනැතිව එම පත්වීම ස්ථිරකර V වන ශ්‍රේණියේ විනය විභාග නිලධාරි තැනට පත්කර ඇති බවත්,

4. පී. සෙව්මිණි චාරුණි පීරිස් මෙනවියටද, එන්. ඩබ්. පී. මදුෂිකා ප්‍රියානි මෙනවියට ද, එම්. ඩබ්. යූ. එස්. බණ්ඩාර මැදිවක මහතාට ද ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමණාකාර මඟින් පත්වීම් ලිපි 3ක් ප්‍රදානයකර ඔවුන් දැනටමත් ශ්‍රී ලංගමය තුළ සේවය කරමින් සිටින බවටත්,

5. ඉල්ලුම්කරු මාසිකව රු. 40,000/- කට අධික වැටුපක් ලබාගත් බවටත්,

6. වගඋත්තරකරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය චක්‍රලිපියක් නිකුත්කර, සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, චක්‍ර ලිපියට අනුව නියමිත තනතුර ලබානොදී ආවරණ පත්වීමක් ලබාදී තනතුරේ රාජකාරි කරවාගෙන හිමි වැටුප් ලබානොදී, වෙනත් අයට ලබාදුන් ආවරණ පත්වීම් ස්ථිරකර අසමානලෙස සලකා ඇති බවත් ප්‍රකාශ කරමින්, වගඋත්තරකරුගේ උත්තර ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලෙසත්, හිඟ වැටුප්, අහිමි කරනලද තනතුර සහ නඩු ගාස්තු ලබාදෙන ලෙසත්, ගරු කාර්මික අධිකරණයට උචිත යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදෙන ලෙසත් අයැද ඇත.

අනතුරුව නඩුව විභාගයට ගැනීමට පෙර ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු විසින් ඉදිරිපත්කර ඇති ප්‍රකාශයන් සමග අමුණා ඇති ලේඛනවලින් ඒ ඒ පාර්ශව පිළිගනු ලබන සහ ප්‍රතික්ෂේප කරනු ලබන ලේඛන මොනවාද යන්න දින 14ක් ඇතුළත දිවුරුම් ප්‍රකාශයකින් ගොනුකරන ලෙසත්, පළමුවන විමසීමේ දිනයට දින 14කට පෙර ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය වගඋත්තරකරුට පිටපත් සහිතව ගොනුකරන ලෙසත් ගරු අධිකරණය විසින් 2023.01.27 වන දින නියෝගකර ඇත.

ඒ අනුව ඉල්ලුම්කරු විසින් 2023.02.08 වන දින සිය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය ගොනුකරමින්, වගඋත්තරකරුගේ පළමු හෝ දෙවන ප්‍රකාශ සමග කිසිදු ලේඛනයක් ඉදිරිපත්කර නැති බව සඳහන්කර ඇති අතර වැඩිදුරටත් දක්වා ඇත්තේ,

1. 2013.09.20 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණය අනුව 2013.12.23 වැනි දිනැති පත්වීමේ ලිපිය මඟින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුව විනය විභාග නිලධාරි තනතුර ආවරණය කිරීමට පත්කරනලද බවත්,

2. වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරු වෙත ලබාදෙන ලද ආවරණ පත්වීම ස්ථිරකර දෙන ලෙස ඉල්ලුම්කරු විසින් 2015.03.25 දිනැතිව අභියාචනයක් ඉදිරිපත් කරනලද බවත්,

3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගාල්ල ඩිපෝවේ 2වන පෙළ කාර්මික සී. පී. කණ්ඩම්බි මහතා මණ්ඩලයේ පැවති විනය විභාගයක දී සේවයෙන් පහකිරීම හේතුකොටගෙන කම්කරු විනිශ්චය සභාවට නඩුවක් ගොනුකර එයින් ලැබුණු තීන්දුවට විරුද්ධව වගඋත්තරකරු මහාධිකරණයට අභියාචනයක් කර තිබිය දී එම අභියාචනය ඉල්ලා අස්කරගැනීමට පාලනාධිකාරිය විසින් කටයුතු කරනු ලබනබව දන්වමින් එකී සේවකයාගේ සේවය 2015.02.10 වන දිනැතිව එම සේවකතැනගේ සේවය ප්‍රතිස්ථාපනය කරනලද බවත්,

4. එලෙස ප්‍රතිස්ථාපනය කරනලද සී. පී කණ්ඩම්බි සේවකයාවෙත IVවන ශ්‍රේණියේ කර්මාන්ත ඉංජිනේරු ආවරණ තනතුරක් 2015.04.07 වන දිනැතිව ලබාදී 2015.05.12 වන දින එකී පත්වීම ස්ථිරකර වැටුප්ගෙවා ඇති බවත්,

5. වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුහට ආවරණ පත්වීම් ලබාදුන් දිනයේදීම එම තනතුරටම ආවරණ පත්වීමක් ලබාදුන් කේ. පී. විමලසේන යන අයට එම පත්වීම 2015.06.22 වන දිනැතිව ස්ථිරකර V වන ශ්‍රේණියේ විනය විභාග නිලධාරි තනතුරට පත්කර ඇති බවත්,

6. වගඋත්තරකාර ආයතනයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාරිණිය විසින් ඇයගේ අත්සනින් දෛනික පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් විශාල සංඛ්‍යාවක් ලබාදී ඇති බවත්,

7. මේ ආකාරයට එකම දවසේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලබාගන්නාලද ආවරණ පත්වීම් අසමාන ලෙස සලකා ස්ථිරනොකිරීම මඟින් හා අනිත් අයගේ පත්වීම ස්ථිරකිරීම මත අසමාන ලෙස සලකා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අසාධාරණ සහ අයුක්ති සහගතලෙස කටයුතු කිරීම මේ ආරාවුලට හේතුපාදක වූ බවත්,

සඳහන් කරමින් තමා හට අගතියක් සහ/හෝ අසාධාරණයක් සිදුව ඇති හෙයින් ඒ මත සහන අයැද ඇත.

එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ප්‍රධාන විධායක නිලධාරි ගලපිටගෙදර මුදියන්සේලාගේ මහේෂ් කුලතිලක යන අය විසින් 2023.02.22 වන දිනැතිව ඉදිරිපත්කර ඇති දිවුරුම් ප්‍රකාශය මඟින් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත්කර ඇති A6, A7, A8, A9 යන ලේඛන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාර විසින් නිකුත්කරනලද ලේඛනබව පමණක් පිළිගෙන ඇති අතර A1 - A5 දක්වාවන ලේඛන පිළිගන්නවාද නැද්ද යන්න පිළිබඳව එකී දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගතකොට නැත. එහෙයින් වගඋත්තරකරු විසින් එකී ලේඛන පිළිගත්තාසේ සැලකීමට හැකි බව සටහන් තබමි.

ඉල්ලුම්කරුගේ සහ වගඋත්තරකරුගේ උත්තරවාද මඟින් පහත සඳහන් කරුණු දෙපාර්ශවය විසින් පිළිගෙන ඇත.

- ඕ. පී. එන්. කේ. සී පෙරේරා මහතාට 2013.09.20 වැනි දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා 2013.12.23 වන දිනැතිව විනය විභාග නිලධාරි තනතුර ආවරණය කිරීමට පත්වීමක් ලබා දී ඇතිබව පිළිගනී.

- ඉල්ලුම්කරු මුල්වරට 2006.12.11 වන දින ඩිපෝ/මාර්ග පරීක්ෂක - Viii A තනතුරට පත්ව ඇතිබව පිළිගනී.

- ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ ශ්‍රී ලංගම/මාසක/පී එල් ආර්/176(ii)/2008 හා 2008.09.25 වන දිනැති ලිපිය මඟින් ඉල්ලුම්කරුගේ තනතුරු නාමය Viii B ශ්‍රේණියේ ලිපිකරු වශයෙන් සංශෝධනයකර ඇති බව පිළිගනී.

- ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ 2010.10.12 දිනැති හා අංක ශ්‍රී ලංගම/මාසක/සේවය/ස්ථිර/2010 දිනැති ලිපිය මගින් Viii B ශ්‍රේණියේ ලිපිකරු තනතුර ලබාදී ඇති බව පිළිගනී.

ඉහතකී මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයමත ඇරඹී සාක්ෂි විභාගයේදී, ඉල්ලුම්කරුව හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව නැවත ප්‍රශ්න ඇසීමකින් තොරව ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කරනලදී.

අනතුරුව, වගඋත්තරකරු වෙනුවෙන් එකම සාක්ෂිකරු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කොට්ඨාසයේ සහකාර මානව සම්පත් කළමණාකාරිණී (කාර්මික සබඳතා) යමුනා දසනායක මහත්මිය A 84/2022 දරන නඩුවට ලබාදුන් සාක්ෂි මෙම නඩුවටද අදාළ බැවින් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව යොදාගැනීමට පාර්ශ්වයන් විසින් කරන ලද ඉල්ලීමට ගරු කාර්මික අධිකරණය විසින් 2023.03.08 වනදින අවසරලබාදී ඇති අතර එදිනම එකී සාක්ෂිකාරිය තවදුරටත් මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට ලක්කරමින් R1 සිට R9 දක්වා ලේඛන ලකුණුකර වගඋත්තරකරුගේ නඩුව අවසන්කර ඇත.

ඉහත සඳහන් එක් එක් කරුණු මෙම ආරාවුලට අදාල සාක්ෂි විභාගයේදී කොපමණ දුරට වගඋත්තරකරු විසින් පිළිගෙන තිබේද එසේත් නැතහොත් ඉල්ලුම්කරු විසින් ඔප්පුකර තිබේද යන්න විමසා සිටිමි. ඒ අනුව, ඉල්ලුම්කරු විසින් අයැද ඇති කිනම් සහන ප්‍රදානයකළ හැක්කේද සහ කිනම් සහන බැහැර කළ යුත්තේද යන්න තීරණය වනු ඇති අතර විසඳියයුතු ප්‍රධාන කරුණු පහත සඳහන් පරිදි වේ.

i. ඉල්ලුම්කරුට 2013.09.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී විනය විභාග නිළධාරී ආවරණ තනතුරට කරනලද පත්කිරීම අනුව V වන ශ්‍රේණියට අදාල වැටුප හිමිද?

ii. ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කළ යුතුද ?

iii. එසේ නොකිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී තිබේද?

iv. ඉල්ලුම්කරුට හිමිවියයුතු සහන කවරේද?

බේරුම්කරු වශයෙන් මාගේ කාර්යභාරය වනුයේ පරීක්ෂණයේ ස්වභාවය, ආරවුල ඉදිරිපත් කරනු ලබන අවස්ථාව වනවිට පාර්ශ්වයන්ගේ අයිතීන් හා වගකීම් සහ අයැද ඇති සහන මත සාධාරණ සහ යුක්ති සහගත (*just and equitable*) ප්‍රදානයක් ලබාදීමයි. එවැනි සාධාරණ සහ යුක්ති සහගත (*just and equitable*) ප්‍රදානයක් ලබාදීම සඳහා ඉහතකී විසඳියයුතු ප්‍රශ්න පිළිබඳව එක්ව සහ/හෝ වෙන් වෙන්ව සවිස්තරාත්මකව විමසා බලනු ලබන අතර *Thirunavakarasu v. Siriwardena (1981) 1 SLR 185 at 191* නඩුව ප්‍රකාර බලතල ක්‍රියාවට නංවනු ඇත.

" *An industrial arbitrator has much wider powers both as regards scope of the inquiry and the kind of orders he can make than an arbitrator in civil law. In short, we can fairly say that arbitration under the industrial law intended to be even more liberal, informal, and flexible than the commercial arbitration* "

01. ඉල්ලුම්කරුට 2013.09.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී විනය විභාග නිළධාරී ආවරණ තනතුරට කරනලද පත්කිරීම අනුව Vවන ශ්‍රේණියට අදාල වැටුප හිමිද? ඉල්ලුම්කරුගේ සේවය ස්ථිරකළ යුතුද? එසේ නොකිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී තිබේද?

මෙහිදී ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ අංක ශ්‍රී ලංගම/මාසක/ආවරණපත්/විධා/42/2013 හා 2013.12.23 දිනැති ලිපිය මඟින් ඉල්ලුම්කරුව විනය විභාග නිළධාරී තනතුර ආවරණය කිරීම සඳහා පත්කර ඇති බව දෙපාර්ශ්වය හබයකින් තොරව පිළිගනී. ඉල්ලුම්කරු විසින් අදාල තනතුර සඳහා සුදුසුකම් සපුරා නොතිබුණේ නම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉල්ලුම්කරුව එම තනතුර සඳහා පත්නොකළ යුතුව තිබුණි. එකී තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේදී ඊට අදාල චක්‍රලේඛයේද අදාල සුදුසුකම් සපුරා නොමැති සේවකයින්ගේ අයදුම්පත් ඉදිරිපත් නොකිරීමට ස්ථානභාර/අංශභාර නිළධාරී මහතුන් සහ ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර තරයේ වගබලාගතයුතු බවත්, විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද විභාග ප්‍රතිඵල ලේඛන ඉදිරිපත්කිරීමට අපොහොසත්වන අයදුම්පත්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බවත් සඳහන්ව ඇති බවද නිරීක්ෂණයවන බැවින් ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සෑහීමට පත්ව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් එකී තනතුරට ඉල්ලුම්කරුව පත්කොට ඇති බව පෙනීයයි.

ඒ අනුව ඉල්ලුම්කරුගේ සේවය ස්ථිරකළ යුතුද? ඉල්ලුම්කරුට V වන ශ්‍රේණියට අදාල වැටුප හිමිද? සහ එකී උසස්වීම් සහ වැටුප්

මෙතෙක් ලබානොදීම මඟින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී තිබේද? යන්න සොයා බැලිය යුතුය.

වගඋත්තරකරු ප්‍රකාශකර සිටින්නේ, වගඋත්තරකරුට එරෙහිව පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවලදී ලබාදී ඇති අතුරු නියෝග අනුව ආයතනය අවහිරයකින් තොරව පවත්වාගෙනයාම සඳහා පහත කොන්දේසිවලට යටත්ව ආවරණ ලිපි ලබාදියහැකි බව තීරණයකර ඇති බවයි. එනම්:

01. එකී පත්වීම් ලබාදීමට පවතින සේවා අවශ්‍යතාවය
02. එම පත්වීම් උසස්වීමක ස්වාභාවයක් නොදැරිය යුතුය.
03. එම පත්වීම මඟින් වැටුප් වැඩිවීමක් නොවිය යුතුය.
04. එම පත්වීම් ලබාදීමට පෙර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබානොගත්තේ නම් එලෙස පත්වීම් ලබාදුන් ලැයිස්තුව මීළඟ නඩු දිනයට සතියකට පෙර මෝසමක් මඟින් අධිකරණයේ ගොනුකළ යුතුවේ.

එසේහෙයින්, වග උත්තරකරුගේ ස්ථාවරය වන්නේ විනය විභාග නිළධාරී තනතුරට පත්වන සේවකයින් අවම ලෙස V වන ශ්‍රේණියේ නිළධාරියෙකු වියයුතු බවත්, ඉල්ලුම්කරු දැනට සිටින්නේ Vii A ශ්‍රේණියේ වන බවත්, එම නිසා ඉල්ලුම්කරුට උසස්වීමක් ලැබෙන ආකාරයෙන් ආවරණ පත්වීම ස්ථිරකිරීමට හැකියාවක් නොමැති බවත්ය. ඉල්ලුම්කරු වෙත නිකුත්කරඇති ඉහත කී පත්වීමේ ලිපියේ වැටුප් වැඩිකිරීමක් හෝ ශ්‍රේණියේ කිසිදු වෙනසක් සිදුනොවන බව සඳහන්කර ඇති බවත්, ඉල්ලුම්කරු ඉන් බැඳී පවතින බවත්, වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශකර සිටී.

එසේම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ආයතනික ව්‍යුහය සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගැනීම සම්බන්ධයෙන් කළමණාකරණසේවා දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් පවතින බවත්, සේවකයින් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගැනීමේ ක්‍රියාවලිය අවසන් අධියරේ පවතින බවත්, එබැවින් මෙම අවස්ථාවේදී මෙම ක්‍රියාවලියට බාහිරව හෝ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උසස් වීම් ලබාදීමට හැකියාවක් නොමැති බවත් ප්‍රකාශකර ඇතත් වගඋත්තරකරුගේ එම ස්ථාවරය සාක්ෂි ලබාදීමේදී ඊට පටහැනි සාක්ෂි ලබාදෙමින් වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂිලබාදුන් සාක්ෂිකාරිය විසින්ම බිඳහෙලා ඇති බව පහත උපුටා දැක්වීම් මඟින් පැහැදිලිව පෙනීයයි.

2023.03.08 වන දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය. සහකාර මානව සම්පත් කළමණාකාර (කාර්මික සම්බන්ධතා) 17 වන පිටුව - අධිකරණයෙන් විමසූ ප්‍රශ්න

ප්‍ර - නමුත් *covering appointment* එකේ ඉන්න කෙනෙකුට promotion එකක් දෙන්න එපා කියලා මේකෙන් අදහස් වෙනවද?

පි - නැහැ ස්වාමීනී

ප්‍ර - නමුත් මේ කියන්නේ අලුතින් ආවරණ පත්වීම් දෙනඑක නේද?

පි - ඔව්

ප්‍ර - මේ අත්හිටුවීමේ නියෝගයේ තිබෙන්නේ අලුතින් දෙන ආවරණ පත්වීමක් මෙන්න මේ සීමා දෙක ඇතුළේ දෙන්න ඕනෑ කියලා, නමුත් දීලා තිබෙන ආවරණ පත්වීමක් ස්ථිර කිරීමක් ගැන මේකෙ තහනමක් නැහැ නේද?

පි - මේ දීලා තියෙන එකේ සඳහන් නැහැ

එසේම, ශ්‍රේෂ්ඨාධිකරණ අතුරු නියෝග බලපැවැත්වෙන්නේ 2019.07.17, 2019.09.24 යන දිනයන්හිදී සිට බවත්, ඉල්ලුම්කරුගේ ආවරණ පත්වීමේ ලිපිය නිකුත්කර ඇත්තේ ඊට වසර ගණනාවකට පෙර 2013.12.23 වන දිනදී වන බවත්, ඉල්ලුම්කරුගේ ආවරණ පත්වීමේ ලිපිය නිකුත්කළ දිනම එම තනතුර සඳහාම ආවරණ පත්වීමේ ලිපි නිකුත්කරන ලද වෙනත් සේවකයින්ගේ තනතුරු ස්ථිර කිරීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කටයුතුකර ඇති බවත්, එලෙස ස්ථිර කිරීමේදී ඔවුන්ගේ ශ්‍රේණිය V වන ශ්‍රේණිය දක්වා උසස්කර ඇති බවත් නිරීක්ෂණය කරමි.

2023.03.08 වන දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමණාකාර (කාර්මික සම්බන්ධතා) 28 වන පිටුව

ප්‍ර - දැන් මේ ඉල්ලුම්කාරයාව ස්ථිර නොකිරීමේ හේතුව නම් R8 සහ R9 ලේඛණයද?

පි - දැනට තිබෙන්නේ එම හේතුව

ප්‍ර -එතකොට මේ හේතුව පැන නඟින්නේ 2019.07.17 ඉඳන් නේද ?

පි- ඔව්

ප්‍ර - මේ හේතුව නොමැතිනම් මේ ඉල්ලුම්කාර ඕ. පී. එන්. කේ. සී. පෙරේරා මහතා ස්ථිර කිරීමට බාධාවක් තියෙනවද?

පි - නැහැ

තවද, වගඋත්තරකරුගේ ස්ථාවරය අනුව අයැදුම්පත් කැඳවීමේ දී මෙම විනය විභාග පරීක්ෂණ නිලධාරි තනතුර සඳහා අයැදුම්පත් කැඳවිය යුතු අවම සුදුසුකම V වන ශ්‍රේණියේ සේවකයකු නම් ඒ සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දී එකී සුදුසුකම් සපුරන අයැදුම්කරුවන්ට පමණක් අයැදුම්පත් එවන ලෙස ඊට අදාළ චක්‍රලේඛයේ සඳහන් කළ යුතුය. නමුත් විනය විභාග නිලධාරි තනතුර V - ශ්‍රේණිය සඳහා අයැදුම්පත් කැඳවීමේ දී එකී චක්‍රලේඛයේ එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් 1.6 යටතේ දක්වා ඇත්තේ, **අ.පො.ස. (සා/පෙළ) සමත්වී VIII ශ්‍රේණියේ යතුරු ලිපිකරුවන් ඇතුළුව විනය අංශයේ කටයුතු පිළිබඳව වසර අටක (08) පළපුරුද්ද ඇත්නම් ඒ සඳහා අයැදුම්පතක් ඉදිරිපත් කළ හැකි බවයි.** ඒ යටතේ අයැදුම්පතක් යොමුකොට ඇති ඉල්ලුම්කරු බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ද සමත්ව විනය විභාග නිලධාරි ආවරණ තනතුරට පත්ව ඇති හෙයින් අදාළ පුහුණු කාලසීමාව (ඇත්නම්) අවසානයේ ඔහුගේ තනතුර විනය විභාග නිලධාරි (V ශ්‍රේණිය) ලෙස උසස් වියයුතු බව තීරණය කරමි. එසේම එකී කාලය තුළ වෙනත් නිලධාරීන්ගේ පත්වීම් ද උසස්කර ඇති බව සහ ඔවුන්ගේ වැටුප් වැඩිකර ඇති බව ද, ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර නොකිරීමෙන් සහ ඔහුගේ වැටුප් වැඩි නොකිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇති බව ද, නිලධාරීන් උසස්කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු සතුව නිසි ක්‍රමවේදයක් නොමැති බව ද නිරීක්ෂණය කරමි.

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමනාකරණ (කාර්මික සම්බන්ධතා) 19 සහ 20 වන පිටු.

ප්‍ර - සාක්ෂිකාරිය දැනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උසස්වීම් කාර්යය පටිපාටියක් තිබෙනව ද?

පි - නැහැ

ප්‍ර - බඳවා ගැනීමේ කාර්යය පටිපාටියක් ක්‍රියාත්මක වෙනවාද දැනට ?

පි - නැත ස්වාමිනී

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමනාකරණ (කාර්මික සම්බන්ධතා) 20 සහ 21 වන පිටු - අධිකරණයෙන් විමසූ ප්‍රශ්න

ප්‍ර - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් පමණයි ආයතනයේ සේවකයෝ ස්ථිර කරන්න ඕනේ, බඳවාගන්න ඕනේ කියලා කොහේ හෝ සඳහනක් තියෙනව ද ? මොකද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනම පනතකින් පිහිටවපු සංස්ථාවක් නේද ?

පි - එහෙමයි ස්වාමිනී

ප්‍ර - එතකොට එහි අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ තීරණ ගන්න පුළුවන් නේද ?

පි - එහෙමයි

ප්‍ර - රේඛීය දෙපාර්තමේන්තුවේ අමාත්‍යවරයාගේ පාලනයට යටත්ව තීරණ ගන්න පුළුවන් නේද ?

පි - එහෙමයි

ප්‍ර - එතකොට කොහොමද කියන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මතය විමසන්නේ නැතුව සේවකයෙක් උසස් කරන්න බැහැ කියන පදනම කුමක් ද ?

පි - උසස්වීම් ලබා දෙන්න පුළුවන් එයාලා කියන්නේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරලා සුදුසුම කෙනා පත්කරන්න ඕනේ කියන එක

ප්‍ර - ඒ කියන්නේ පූර්ව නිර්ණායකයක් විනා කරන්න එපා කියලා නැහැ නේද ?

පි - එපා කියලා නැහැ ඒගොල්ලෝ දැනුම්දීලා තියෙනවා මේ තනතුරට සුදුසුකෙනා පත්කරන්න ඕනෙ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරලා

එසේම ඉල්ලුම්කරු විසින් A 3 වශයෙන් ලකුණුකර ඉදිරිපත් කර ඇති 2019.02.11 වැනි දිනැති සහකාර මානව සම්පත් කළමනාකරණ (විනය) මගින්, ප්‍රධාන මානව සම්පත් කළමනාකරණ තැන මගින්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමා වෙත විනය විභාග නිලධාරි තනතුර ස්ථිර කරගැනීම සඳහා යොමුකොට ඇති ලිපිය මගින් ඉල්ලුම්කරු විසින් සිය තනතුර සහ ඊට අදාළ ශ්‍රේණිය සිය පත්වීමේ දින සිට බලාත්මක වන පරිදි ස්ථිරකර ගැනීම උදෙසා ගරු සභාපතිතුමා වෙත 2018.07.31 වැනි දින ද ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ බව ද සඳහන් කර ඇත. එසේම එකී ලිපියට පැති සටහනක් යොදමින් ගමනාගමන මණ්ඩලයේ සහකාර මානව සම්පත් කළමනාකාර (විනය) විසින් ''මෙම විභාග නිලධාරි මහතා මාගේ උපදෙස් පරිදි ලබාදෙන විනය ලිපිගොනු පිළිවෙත් ප්‍රකාරව විධිමත් අයුරින් පවත්වා අවසන්කර මාවෙත යොමුකරන අතර මොහු කරන ලද ඉල්ලීම ලබාදීමට සුදුසු බව'' නිර්දේශකොට ඇති බවත්, එකී නිර්දේශ කිරීම 2019 වර්ෂයේ දී කර ඇති බවත්, එකී A 3 ලේඛනය වගඋත්තරකරු විසින් ප්‍රතික්ෂේපකොට නොමැති බැවින් එකී ලේඛනය පිළිගත්තා සේ සැලකිය හැකි බවත් වැඩිදුරටත් නිරීක්ෂණය කරමි.

ඉහත සඳහන් කළ පරිදි උත්තරවාදවල සඳහන් කරුණු සහ සාක්ෂි විභාගයේ දී ඉදිරිපත් වූ කරුණු අනුසාරයෙන් විමසා බලන කළ අනෙකුත් නිලධාරීන්ගේ තනතුරු ස්ථිර හෝ උසස්කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවලදී ලබාදී ඇති අතුරු නියෝග අදාළ කරගෙන නොමැති බවත්, ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් ද එකී අතුරු නියෝග අදාළ නොවන බවට සාක්ෂි ලබාදී ඇති බවත්, ඉතා පැහැදිලි බැවින් ඉල්ලුම්කරුගේ පත්වීම ස්ථිර නොකිරීමෙන් සහ එම තනතුර සඳහා හිමිවිය යුතු වැටුප ලබානොදීමෙන් ඉල්ලුම්කරුහට අසාධාරණයක් වී ඇති බවටත්, ඔහුගේ තනතුර ස්ථිර වියයුතු බවටත්, ඒ අනුව ඔහුගේ ශ්‍රේණිය V වන ශ්‍රේණිය දක්වා උසස්කළ යුතු බවටත්, එම තනතුර සඳහා ලැබිය යුතු වැටුප හිමිවිය යුතු බවටත් තීරණය කරමි.

එසේම පහත නඩු තීන්දු මගින් ද සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බව පෙන්වා දී ඇත.

*Ramupillai vs Minister of Public Administration, Provincial Councils and Home affairs and others 1991 (1) Sri. L. R. at 44 දරන නඩුවේ දී රණසිංහ අගවිනිසුරුතුමන් විසින් නඩු තීන්දු ගණනාවක් උපුටා දක්වමින්, සේවක අයිතීන් අභිමුව නීතිය පසිඳලීම (equality before law) සහ නීතියේ රැකවරණය (equal protection of law) යන සංකල්ප මනාව විග්‍රහකර ඇත. ඒ අනුව, State of Kerala vs. Thomas and others IR 1976 SC 490, Probhudas Morarjee vs. Union of India AIR 1966 SC 1044, Railway Express Agency vs. New York (1949) 336 US 100, S. C. Perera vs. University Grants Commission S. C. Application No. 88 of 1980 යන නඩු තීන්දු ගෙනහැර දක්වමින් තීරණයකර ඇත්තේ, සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බවයි. එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රකාර සමානාත්මතාව යන්න විමසා ඇත.*

"*The provisions of Article 12(1) and (2) bring within their reach equality of opportunity for employment as well and that such guarantee of equality applies not only in the matter of selection for employment, but also at the stage of selection for promotion.*"

*තවද, රාජ්‍ය සේවයේ සමාන අවස්ථා සැලසීම සේවයට තෝරා ගැනීමේ දී මෙන්ම යම් තනතුරුවලට උසස් කිරීමේ දී ද තහවුරු වියයුතු බව එකී නඩුවේදී ම Seervai, Constitutional Law of India, Volume 1, 3rd Edition හි 423 වන පිටුව උපුටා දක්වමින් තීරණයකර ඇත.*

"*Equality of opportunity in matters of public employment cannot be confined to the initial matters prior to the act of employment, but include other matters relating to employment, such as promotion to selected posts*."

02. ඉල්ලුම්කරුට හිමිවිය යුතු සහන කවරේ ද ?

ඉහත සාක්ෂි සම්පිණ්ඩනය මත ඉල්ලුම්කරු නිසි ශ්‍රේණියේ පිහිටුවා නොමැති බව වැඩිබර සාක්ෂි සහ පිළිගත් කරුණු මත ඔප්පුකොට ඇති හෙයින්, ඉල්ලුම්කරුට වැටුප් විෂමතාවක් සිදුව ඇති බව ද තහවුරු වේ.

2023.03.08 වැනි දිනැති සටහන්, යමුනා දහනායක මහත්මිය, සහකාර මානව සම්පත් කළමනාකරණ (කාර්මික සම්බන්ධතා) 18 වන පිටුව - අධිකරණය විසින් අසන ලද ප්‍රශ්න

ප්‍ර - සාක්ෂිකාරිය ඔබතුමියට කියන්න පුළුවන් ද මේ ඉල්ලුම්කරු යම් දවසක ස්ථිර කළොත් වැටුපේ පරතරය ගැන කිසිම අදහසක් මෙහි නැහැ නේද ? කොහොමද අපි ඒ වගේ එකක් අධ්‍යයනය කරගන්නේ කොච්චර ද කියලා?

පි - V සහ VII අතර තිබෙන වැටුප් වෙනස

ඒ අනුව 2013.12.23 වැනි දින සිට 2022.11.02 දින දක්වා ඉල්ලුම්කරුගේ විනය විභාග නිලධාරි තනතුර V ශ්‍රේණියට උසස් කළේ නම් එක් එක් වර්ෂය සඳහා වැටුප් වර්ධක සහ අනෙකුත් දීමනා හිමිවිය යුතු ආකාරය අවරෝහණ පිළිවෙලට ස්ථිර කිරීමට අදාළ වර්ෂ ගණන අඩුවෙන පිළිවෙලට වෙන වෙනම එකී ගණනයන් ගණනය කර සම්පූර්න වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට ප්‍රධාන මූල්‍ය කළමනාකරු හෝ නියෝජිතයකුට කරන ලද නියමය අනුව ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව ගෙවිය යුතුව පවතින හිඟ මුදල වන රු. 41,684.75ක (රුපියල් හතළිස් එක් දහස් හයසිය අසූ හතරයි ශත හැත්තෑ පහක) මුදල මෙම නියෝගය *ගැසට්ගත* කිරීමෙන් මසක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස ද, මින් ඉදිරියට V වන ශ්‍රේණියට නියමිත වැටුප ඉල්ලුම්කරු වෙත ගෙවන ලෙසට ද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කරමි. මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

බණ්ඩාර සෙනරත්,
බේරුම්කරු.

2023 අගෝස්තු මස 10 දින

EOG 09 - 0198

---

මගේ අංකය: IR/COM/02/2017/112.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2335/07 දරන හා 2023.06.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් පොල්ගස්ඕවිට, සියඹලාගොඩ, 5 වන පටුමග, රණතිස්ස උයන, අංක 200 ඒ 55 හි පදිංචි ඩබ්. ඒ. ධර්මදාස මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 01/2019 දරන හා 2023.04.20 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩබ්. ඒ. ධර්මදාස මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 01/2019 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2024.06.06 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ඩබ්. ඒ. ධර්මදාස
අංක 200 A 05, රණතිස්ස උයන,
05 වන පටුමග,
සියඹලාගොඩ, පොල්ගස්ඕවිට.
දිනය : 2023.07.07

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2023.06.06 දිනැති අංක 2335/07 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, ඩබ්. ඒ. ධර්මදාස සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2023.04.20 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන* -

*පිටපත* - (අනෙක් පාර්ශ්වය)

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 09 – 0199

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.